# සමාජ අභියෝග හමුවේ බුදුදහමේ ව්‍යාප්තියට ගද්‍ය සාහිත්‍යය දැක්වූ දයකත්වය

## (අමාවතුර සහ බුත්සරණ ඇසුරින්)

පිටතලාවේ විමලසාර හිමි[1]

### හැඳින්වීම

පොළොන්නරුව ආගමික වශයෙන් සුවිශේෂී සන්ධිස්ථානයක් සටහන් කළ අවධියකි. විශේෂයේ අනුරාධුපර යුගයේ අවසන් පාලකයා වූ පස්වන මිහිඳු රජු සොළීන්ගේ ග්‍රහණයට නතුවීමෙන් පසු ලංකාව දෙමළ පාලනයට නතුවිය. සොළී බලය ලංකාව පුරා ව්‍යාප්ත වන විට හින්දු සමය නිසා ඇති වූ දේව පූජා සහ දේව ඇදහිලිවලට සමාජයේ ප්‍රමුඛස්ථානයක් ලැබිණ. දෙවියන් බලගන්වමින් සිදුකෙරෙන මෙම පූජාවල පවතින ගුප්ත බව, විසිතුරු බව හේතුවෙන් බෞද්ධ ජනයා ඉතා ඉක්මණින් ඒ වෙත ඇදී ගියේය. එසේම අනුරාධපුරයේදී ආරම්භ වූ අභයගිරිය කේන්ද්‍රීයව ව්‍යාප්ත වූ මහායානය පොළොන්නරු යුගයේදී වඩාත් ප්‍රබල ලෙස උත්සන්න විය. ගෘහ නිර්මාණ, මූර්ති, චිත්‍ර ආදී කලාංගවල පවා නිර්මාණය වූයේ මහායානයේ බලපෑමෙනි. මහායානයේද විචිත්‍රාකරයෙන් සිදුකරන පූජා චාරිත්‍ර රාශියක් පවතී. විශේෂයෙන් මහායානයේ දේවතා කුලයෙහිදී හින්දු දේවතා කුලයෙහි මෙන් දෙවිවරු බහුල වූහ. එබැවින් බෞද්ධ ජනයා බුදුදහම අතහැර දේවවාදී අදහස් පෙරදැරි කරගත් හින්දු සමයට සහ මහායාන පුද පූජා චාරිත්‍රවලට ඉක්මණින් ආකර්ෂණය විය. මෙවැනි පසුබිමක් මත බුදුදහමින් ඈත්ව යන පොදු ජනයා නැවත බුදුදහම වෙත ඒකරාශී කරවීම පිණිස සාහිත්‍ය නිර්මාණකරුවන් අනුගමනය කළ ක්‍රියාමාර්ග කවරේද? සාහිත්‍ය නිර්මාණ තුළ භාවිත කළ උපක්‍රම කවරේද? යනාදිය පිළිබඳ පර්යේෂණාත්මකව විමසා බැලීම මෙහි ප්‍රධාන අරමුණ වේ.

### පර්යේෂණ ක්‍රම වේදය

අමාවතුර, බුත්සරණ සහ සාහිත්‍ය මූලාශ්‍රයන් ඇසුරින් ද ප්‍රාමාණික විද්වතුන් හමුවී කරුණු සාකච්ඡා කිරීමෙන් ද පර්යේෂණය සිදුකෙරේ.

### දත්ත විශ්ලේෂණය

මහින්දගමනයෙන් පසු ලංකාව ථේරවාදී බුදුහමෙහි කේන්ද්‍රස්ථානයක් වුවද අනුරාධපුර යුගයේදීම අභයගිරිය ස්ථාපිත වීමත් සමග මහායානයේ ආගමනය

[1] සහාය කථිකාචාර්ය, සිංහල අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
wimsarap@gmail.com

සිදුවිය. අඩු වැඩි වෙමින් ආ මහායානයේ බලපෑම ගෘහ නිර්මාණය, මූර්ති, කලා ආදි සෑම ක්ෂේත්‍රයන් කරා විහිදීමට තරම් පොළොන්නරු යුගයේදී ප්‍රබලව වර්ධනය විය. නූතනයේදී පවා ශේෂව ඇති පොළොන්නරු ගල්විහාරය, තිවංක පිළිම ගෙය වැනි ඉදිකිරීම් විමසීමේදී මෙය මනාව තහවුරු වේ. මහායානයේ අනුෂංගයක් වන දේවතා කුලය පදනම්ව ඇත්තේ දේව වන්දනය මතය. ඒ හේතුවෙන් විවිධාකාරයේ ගුප්ත, අත්භූත පූජා චාරිත ද ක්‍රියාත්මක විය. දුකක් කරදරයක් පැමිණි විට විවිධ පුදපූජාවන් සිදුකරමින් දෙවියන්ට කන්නලව් කිරීමෙන් යහපතක් උදාකරගත හැකිය යන විශ්වාසයක් හින්දු භක්තියක් තුළ පවතී. බුදුසමයේ නොමැති මෙම චාරිත්‍ර වාරිත්‍රවලට ආකර්ෂණය වූ පොදු ජනයා ඉතා ඉක්මණින් ඒ වෙත ඇදී ගියේය. මෙම තත්ත්වය දුටු පොළොන්නරු යුගයේ සාහිත්‍ය නිර්මාණකරුවෝ මෙම තත්ත්වයෙන් පොදු ජනයා මුදා ගැනීම පිණිස සාමකාමී සාහිත්‍යමය අරගලයක් දියත් කළහ. ගුරුළුගෝමී සහ විද්‍යාචක්‍රවර්ති මෙම අරගලයේ නියාමකයෝ වූහ. පොදු ජනයා හින්දු දහම වෙත යොමු වීමට බුදුදහම පිළිබඳ, බුදුරජාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය පිළිබඳ නිවැරදි අවබෝධයක් නොවීම සහ පාලි භාෂා ඥානයක් නොවීම ප්‍රධාන හේතුව විය. එබැවින් ගුරුළුගෝමී සහ විද්‍යාචක්‍රවර්ති පාලි මූලාශ්‍රයවල ධර්මය පිළිබඳ සහ බුදුරජාණන් වහන්සේ සම්බන්ධ පාලි මූලාශ්‍රයන්හි එන තොරතුරු ග්‍රාහකයාට විෂය වන පරිදි ඉදිරිපත් කළේය. එහිදී ඔවුන් අනුගමනය උපක්‍රම කිහිපයකි.

## උචිත වස්තු විෂයක් තෝරාගැනීම

සියලු සත්ත්වයන් අතර බුදුරජාණන් වහන්සේ ශ්‍රේෂ්ඨතම පුද්ගලයා බවත් යක්ෂ, දේව, මනුෂ්‍ය, අමනුෂ්‍ය ආදි සෑම සත්ත්වයෙක්ම බුදුරජාණන් වහන්සේ ඉදිරියේ දුබලයන් බව විදහා දක්වමින් ගුරුළුගෝමී සහ විද්‍යාචක්‍රවර්ති තම නිර්මාණවල වස්තු විෂය සකසා ගත්තේය. ගුරුළුගෝමීන්ගේ අමාවතුර බුදුගුණ අතර පුරුෂදම්මසාරථී ගුණය වස්තු විෂය කරගත්තේය. (බුදුගුණ අනන්ත වන බැවින් නවගුණ හැම කියත් නොපිළිවෙනින් පුරිසදම්මසාරථී යන පදය ගෙනැ...) විද්‍යාචක්‍රවර්තීන්ගේ බුත්සරණෙන් නව අරහාදි බුදුගුණයන්ම ප්‍රකට වන පරිදි කෘතිය නිර්මාණය කළේය. කතුවරුන් දෙදෙනාම සිය කෘති සඳහා වස්තු විෂය සකසා ගන්නේ බුදුරදුන්ගේ ශ්‍රේෂ්ඨත්වය උදාරත්වය ප්‍රකට වන අන්දමිනි. බුදුරජාණන් වහන්සේ පිළිබඳ සඳහන් වන සෑම ස්ථානයකම පාහේ ගුණ වාචක පද යොදා ගැනීමෙන් එම තත්ත්වය වඩාත් තීව්‍ර කරවයි.

## ග්‍රාහකයාට ගැළපෙන පරිදි ග්‍රන්ථකරණය සිදුකිරීම

ගුරුළුගෝමීන්ගේ සහ විද්‍යාචක්‍රවර්තීන්ගේ මෙම සාහිත්‍ය අරගලයේ පවතින සුවිශේෂිත්වය වන්නේ පාඨකයාගේ බුද්ධි මට්ටමට ගැළපෙන පරිදි ග්‍රන්ථකරණයේ නියැලීමයි. ගුරුළුගෝමීන් විසින් අමාවතුර රචනා කරන්නේ වියත්

පාඨක පිරිසක් අරමුණු කරගනිමිනි. කෘතියේ අන්තරගතය සකසාගෙන ඇත්තේ ද වියත් පිරිසට ගැළපෙන පරිදිය. එය පහත කරුණු විමර්ශනයේදී තහවුරු වේ.

1. සංක්ෂිප්ත භාෂා රීතියක් යොද ගැනීම
2. විස්තරාර්ථ රහිත වීම
3. වාක්‍ය සංයෝජනය
4. කථා විලාසය
5. බහුලව අලංකාර භාවිත නොකිරීම

වියත් පිරිසකට යමක් ක්ෂණිකව ග්‍රහණය කරගැනීමට හැකිය. එබැවින් ගුරුළුගෝමීහු කරුණු ඉදිරිපත් කිරීමේදී බුත්සරණේ මෙන් වර්ණනාත්මක, විස්තරාත්මක රීතියක් භාවිත නොකළහ.

ගුරුළුගෝමී වියත් පිරිසට වෙනුවෙන් ග්‍රන්ථකරණයේ යෙදෙනවිට විද්‍යාචක්‍රවර්තීහු සාමාන්‍ය ගැමි ජනයා වෙනුවෙන් ග්‍රන්ථකරණයේ නියැළුණහ. ඔහු විසින් බුත්සරණ රචනා කරන්නේ නොවියත් ගැමි ජනයා අරමුණු කරගනිමිනි. විශේෂයෙන් මෙම යුගයේ ගැමි ජනයාගේ සාක්ෂරතාව ඉහළ මට්ටමක නොවුණ හෙයින් කතුවරයා ග්‍රන්ථය රචනා කරන්නේ ධර්ම දේශක රීතියෙනි. ග්‍රන්ථයේ භාෂා රීතිය සකසාගෙන ඇත්තේ එම අරමුණ ද සාධනය කරගත හැකි පරිදිය.

1. මිශ්‍ර සිංහල භාෂා රීතියක් යොදගැනීම
2. ගුණ වාචක පද භාවිතය
3. කාව්‍යාලංකාර බහුලව යොද ගැනීම
4. වර්ණනාත්මක භාෂා රීතියක් භාවිත කිරීම

අමාවතුර මෙන් කතුවරයා හුදු හෙළ වහර වෙනුවට කෘතියේ ප්‍රධාන භාෂා රීතිය වශයෙන් භාවිත කළේ තත්කාලීන සමාජයේ ජනප්‍රිය ශෛලියක් වූ මිශ්‍ර සිංහල භාෂා රීතියයි. එසේම සැමවිට අලංකාරාත්මක භාෂා ශෛලියක් ඔස්සේ ඉදිරිපත් කරණ කරුණු වර්ණනාත්මකව සහ විස්තරාත්මකව ඉදිරිපත් කළේය. විද්‍යාචක්‍රවර්තීන්ගේ සුවිශේෂිත්වය වන්නේ හැකි සැමවිටම ගුණ වාචක පද භාවිතයයි. එයින් ග්‍රන්ථය කියවන විට ශ්‍රාවකයා තුළ බුදුරජාණන් වහන්සේ පිළිබඳ භක්තිය, ගෞරවය වර්ධනය කිරීම කතුවරයාගේ අරමුණ වේ.

**ආඛ්‍යාන ඔස්සේ කරුණු පැහැදිලි කිරීම**

ගුරුළුගෝමීන් මෙන්ම විද්‍යාචක්‍රවර්තීන් ද ග්‍රන්ථකරණයේදී නිරතුරුව ආඛ්‍යාන රීතිය භාවිත කළේය. විශේෂයෙන් ජාතක කථා සහ ත්‍රිපිටක මූලාශ්‍රයන්හි සඳහන් විවිධ ආඛ්‍යාන අවස්ථා'වෝචිතව, පාඨකයා වටහාගත හැකි අයුරින් යොදගැනීම හේතුවෙන් බුදුරජාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය, උදාරත්වය පාඨකයාට, ශ්‍රාවකයාට සකාරණව, සසාධකව අවබෝධ කරගැනීමට අවස්ථාව උදාවිය.



UNIVERSITY OF SRI LANKA
07 APR 2015

**සමාලෝචනය**

ගුරුළුගෝමීන් විසින් ආරම්භ කරන්නට යෙදුණු විද්‍යාචක්‍රවර්තීන් විසින් ඉදිරියට රැගෙන ආ මෙම සාමකාමී සාහිත්‍ය අරගලය හේතුවෙන් වියත් නොවියත් සැමදෙනාටම බුදුදහම පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබාගත හැකි විය. එයින් නැවත පොදු ජනයා බුදුදහම වෙත ඒකාරාශී වූ අතර එය සාර්ථක ක්‍රමවේදයක් වූ බව දහම් සරණ, සඟ සරණ, පූජාවලිය, සද්ධර්මරත්නාවලිය, සද්ධර්මාලංකාරය, සද්ධර්මරත්නාකරය වශයෙන් පසුකාලීනව මෙවැනි ග්‍රන්ථ රාශියක් බිහිව තිබීමෙන් පැහැදිලි වේ. එසේම පොදු ජනයා මෙම ක්‍රමය කෙතරම් ආකර්ෂණීය වූයේ ද යත් මෑතක් වනතුරු බුත්සරණේ එන වෙස්සන්තර කථාව මළ ගෙවල්වල මළ පොත වශයෙන් භාවිත විය. ගුරුළුගෝමීන් සහ විද්‍යාචක්‍රවර්තීන්ගේ මෙම සාහිත්‍ය ව්‍යාපාරයේ විශේෂත්වය නූතන යුගය හා සංසන්දනයේදී මනාව කැපී පෙනේ. තාක්ෂණික වශයෙන් නූතන සමාජය ඉතා ඉහළ මට්ටමක වැජඹුණ ද පොදු ජනයා තුළ බුද්ධ ධර්මය, බුදුරජාණන් වහන්සේ පිළිබඳ නිවැරදි අවබෝධයක් නොමැති වීම කණගාටුවට කරුණකි. නූතන ගද්‍ය සාහිත්‍යකරණය සඳහා බුද්ධ ධර්මය තේමා කරගත් වස්තු විෂයයන් පාදක වුවද ඒවා ඉදිරිපත් කර ඇති ආකාරයෙන් විෂය වන්නේ සාමාන්‍ය ජනයාට නොව වියත් ජනයාටය. එහෙත් මෙම සාහිත්‍ය ව්‍යාපාරය සමාජයේ වියත් නොවියත් දෙපාර්ශ්වයටම අදාළ වන ලෙස දියත් විය. එබැවින් සැමදෙනාම එය වැළඳ ගත්තේය. නූතනයේ පවා අමාවතුර, බුත්සරණ ඇතුළු සෙසු ග්‍රන්ථ පරම්පරාව පොදු ජනයා අතර ජනප්‍රියත්වයට පත්ව තිබීමෙන් ප්‍රකට වන්නේ, ගුරුළුගෝමී සහ විද්‍යාචක්‍රවර්තී සමාජ අභියෝග හමුවේ බුදුදහම ප්‍රචාරය කිරීමට භවිත කළ ක්‍රමවේදයේ සාර්ථකත්වයි.

**ප්‍රමුඛ පදඃ** පොළොන්නරු යුගය, බුත්සරණ, අමාවතුර, ගුරුළුගෝමී, විද්‍යාචක්‍රවර්තී

**ආශ්‍රිත ග්‍රන්ථ**

*අමාවතුර.* (1967)(සංස්.) කෝදගොඩ ඤාණාලෝක හිමි කොළඹඃ එම්. ඩී. ගුණසේන සහ සමාගම

*බුත්සරණ.* (2002)(සංස්.) බඹරැන්දේ සිරි සීවලී හිමි. රදනඃ ගුණරත්න සහ සමාගම, සහෝදරයෝ. 135 පිටුව.

සන්නස්ගල, පුංචි බණ්ඩාර. (2009). *සිංහල සාහිත්‍ය වංශය.* කොලඹඃ එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සූරවීර, ඒ.වී. (2008). *සිංහල සාහිත්‍ය සම්ප්‍රදය.* කොළඹඃ එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ධර්මකීර්ති හිමි, නිවන්දම. (2002). *සිංහල සාහිත්‍යයේ ස්වර්ණ යුගය.* දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික කටයුතු මධ්‍යස්ථානය.